25 AUG 2017

මගේ අංකය : 01/05/5-6
නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය
බදුළුඔය/ බත්මැඩිල්ල ව්‍යාපාරය
කන්දකැටිය
2017/08/10

සියළුම ව්‍යාපාර කමිටු
සාමාජික මහත්ම මහත්මීන් වෙත,

**ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තාව - 2017 අගෝස්තු මාසය**

බදුළුඔය/ බත්මැඩිල්ල ව්‍යාපාරයේ මාසික ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම 2017/08/10 වන දින පෙ.ව. 9.30ට කන්දකැටිය වාරිමාර්ග ශ්‍රවණාගාරයේදී පැවැත්විය.

**සහභාගී වූ රජයේ නිළධාරීන්**

| නම | තනතුර සහ ආයතනය |
|---|---|
| 01.එස්.එච්.එල්.දයාපාල මයා | - නේවාසික ව්‍යාපාර කළමනාකරු, බදුළුඔය/ බත්මැඩිල්ල ව්‍යාපාරය |
| 02.එස්.බී.මොලගොඩ මයා | - වාරිමාර්ග ඉංජිනේරු, කන්දකැටිය |
| 03.එයි.එම්.එස්.එස්.යාපා මයා | - ආයතන සංවර්ධන නිළධාරී, බදුළුඔය/ බත්මැඩිල්ල ව්‍යාපාරය |
| 04.ජී.ඩබ්.එස්.එස්.කේ.කුලතිලක මිය | - කළමනාකරණ සහකාර, බදුළුඔය/ බත්මැඩිල්ල ව්‍යාපාරය |
| 05.ආර්.එම්.ජානක මයා | - තාක්ෂණික සහයක, බත්මැඩිල්ල ව්‍යාපාරය |
| 06.ඩී.වී.එල්.එම්.දසනායක මයා | - තාක්ෂණික සහයක, කෘෂිකර්ම (අ/ප) |
| 07.ආර්.රොෂාන් ලක්මාල් මයා | - තාක්ෂණික සහයක, බදුළුඔය ව්‍යාපාරය |
| 08.ඩී.එම්.කරුණාවතී මිය | - කෘ.ප.නි.ස (බදුළුඔය/ බටහිර) |
| 09.ආර්.එම්.සුදුමැණිකේ මිය | - කෘ.ප.නි.ස (කන්දකැපුඋල්පත) |
| 10.එච්.ජී.එන්.එරන්දි මෙය | - කෘ.ප.නි.ස (මහතැන්න 30 කි) |
| 11.කේ.ආර්.එම්.හේමලතා මිය | - කෘ.ප.නි.ස (වෙළඹිය) |
| 12.ඩී.එම්.ධර්මදාස මයා | - කෘ.ප.නි.ස (මහකැලෝ) |
| 13.අනුෂ මාතියන්ගම මයා | - ප්‍රාදේශීය කළමණාකරු, ප්‍රිමා ආයතනය |
| 14.නලින් නිශාන්ත මයා | - ප්‍රාදේශීය විධායක නිළධාරී, ප්‍රිමා ආයතනය |

| නම | තනතුර සහ ගොවි සංවිධානය |
|---|---|
| 01.ආර්.එම්.සෙනෙවිරත්න මයා | - ගරු සභාපති, සුචරිත ගොවි සංවිධානය |
| 02.ආර්.එම්.ජයසේන මයා | - ගරු සභාපති, දිලෙනතරු ගොවි සංවිධානය |
| 03.ආර්.එම්.තිලකරත්න බංඩා මයා | - ගරු සභාපති, වීර උදාර ගොවි සංවිධානය |
| 04.නන්දන පියතිස්ස මයා | - ගරු ලේකම්, එක්සත් ගොවි සංවිධානය |
| 05.බී.ජනනාථ් සිරිවර්ධන මයා | - ගරු ලේකම්, වීර උදාර ගොවි සංවිධානය |
| 06.බී.එච්.එම්.පියදාස මයා | - ගරු භාණ්ඩාගාරික, ගජබා ගොවි සංවිධානය |
| 07.මහින්ද දිසානායක මයා | - ගරු සභාපති, සුබුදු ගොවි සංවිධානය |
| 08.ජී.එම්.සූරසේන මයා | - ගරු භාණ්ඩාගාරික, ගැමුණු ගොවි සංවිධානය |
| 09.ආර්.එම්.අනුලාවතී මිය | - ගරු ලේකම්, පැරකුම් ගොවි සංවිධානය |
| 10.ඩී.එම්.ජයසුන්දර මයා | - ගරු සභාපති, ගැමුණු ගොවි සංවිධානය |
| 11.ආර්.එම්.උඩබේසේකර මයා | - ගරු සභාපති, වීර කැප්පෙටිපොල ගොවි සංවිධානය |
| 12.ඩී.එම්.ජේ.අබේවික්‍රමසිංහ මයා | - බත්මැඩිල්ල ජල පාලක |
| 13.ඩී.එම්.සුනිල් ප්‍රේමරත්න මයා | - ගරු සභාපති, වීර පැරකුම් ගොවි සංවිධානය |
| 14.ඩබ්.එම්.ආරියදාස මයා | - ගරු ලේකම්, ගජබා ගොවි සංවිධානය |

15.ඩී.එම්.ගුණපාල මයා - බදුළුඹුය ජල පාලක
16.එච්.ගංඇතිරාල මයා - ගරු සභාපති, පැරකුම් ගොවි සංවිධානය
17.ඩබ්.එම්.ජයවර්ධන මයා - ගරු සභාපති, සමගි ගොවි සංවිධානය
18.ආර්.ඩබ්.එම්.වීරසිංහ මයා - ගරු භාණ්ඩාගාරික, පැරකුම් ගොවි සංවිධානය
19.ඩී.එම්.ගුණසිරි දිසානායක මයා - ගරු භාණ්ඩාගාරික, වීර උදාර ගොවි සංවිධානය
20.ඩබ්.එම්.කරුණාතිලක මයා - ගරු සභාපති, එක්සත් ගොවි සංවිධානය
21.එස්.එම්.රණසිංහ මයා - ගරු ලේකම්, දිලෙනතරු ගොවි සංවිධානය
22.ආර්.එම්.පියසේන මයා - සමගි ගොවි සංවිධානය
23.ඩබ්.එම්.ජයසුන්දර මයා - ගරු සභාපති, ගජබා ගොවි සංවිධානය
24.ආර්.ඩබ්.එම්. කුමාරසිංහ මයා - ගරු ලේකම්, සුචරිත ගොවි සංවිධානය
25.ආර්.එම්.ලොකුබංඩා මයා - ගරු ලේකම්, ගැමුණු ගොවි සංවිධානය
26.ජේ.එම්.වීරකෝන් මයා - ගරු ලේකම්, වීර කැප්පෙටිපොල ගොවි සංවිධානය
27.ආර්.එම්.[illegible] - ගරු භාණ්ඩාගාරික, සමගි ගොවි සංවිධානය

| | වග කිව යුතු ආයතනය හා නිළධාරියා |
|---|---|
| **පිළිගැනීම/ ආගම සිහි කිරීම** | |
| ආගම සිහි කිරීමෙන් අනතුරුව පැමිණ සිටි සියළු දෙනා පිළිගන්නා ලදි.<br>මීළඟට පසුගිය ව්‍යාපාර කළමනාකරණ කමිටුවේ වාර්තා වූ කරුණු සමාලෝචනය කරන ලදි.<br>පැවති ගොවි සංවිධාන නිලවරණ වලින් නව නිළධාරීන් පත්වූ අතර, පෙර එම තනතුරු දැරූ නිළධාරීන් සමඟ, ඔවුන්ගේ අනුශාසනා මැදිහත්වීම සමඟ සමීප සම්බන්ධතාවකින් කටයුතු කිරීම වැදගත් බවත් පැහැදිළි කළේය. | නේවාසික ව්‍යාපාර කළමනාකරු |
| **01.ආයතන සංවර්ධන කටයුතු** | |
| • ***ගොවි සංවිධාන රැස්වීම***<br>2017 වසරට නියමිත නිලවරණ වලින් මැයි, ජූනි මාසයන්හි දී පවත්වා අවසන් කරන ලෙසට ප්‍රධාන කාර්යාලයෙන් දැනුම් දීම නිසා මේ වන විට නිලවරණ හතකින් හයක් අවසන් බවත්, සුචරිත ගොවි සංවිධානයේ නිලවරණය පැවැත්වීමට දින නියම කරගත යුතු බවත් පැවසීය. | ආයතන සංවර්ධන නිළධාරි |
| • ***ගිණුම් විගණනය***<br>මේ වන විට ගොවි සංවිධාන 11න් 09ක් විගණනය කර අවසන් බවත්, කාර්යාලයට නව දත්ත කළමනාකාරිණියක් සිටින නිසා ගොවි සංවිධාන වල ගිණුම් මාසිකව සකස් කරගන්නා ලෙසටද දැන්විය. | |
| • ***පුහුණු කටයුතු***<br>ගොවි සංවිධාන සඳහා පුහුණු පැවැත්වීමේ දී අනිවාර්යෙන් සහභාගී වන ලෙසට ඉල්ලීමක් කළේය.<br>මෙම වසරේ ක්ෂේත්‍ර චාරිකාවක් යාමට නියමිත බැවින් ඒ සඳහාද ගොවි සංවිධාන නිළධාරීන් සහභාගී වීම අත්‍යවශ්‍ය බව සඳහන් කළේය. | |
| **02.වාරිමාර්ග කටයුතු** | |
| විටින් විට වර්ෂාව ලැබීමත් සමඟ මේ වන විට පැවති ජල ගැටළු අවම බවත් අඩි තුනක පමණ මට්ටමක ජලය පවතින බවත් පැවසුවේය.<br>තවද, පවතින තත්වය පිළිබඳ දැනුවත් කරන ලෙසට බත්මැඩිල්ල තාක්ෂණික සහයක මහතාට අවස්ථාව ලබාදෙන ලදි. | වාරිමාර්ග ඉංජිනේරු |

| | |
|---|---|
| <u>බත්මැඩිල්ල ව්‍යාපාරය</u> | |
| මේ දින වලදී වෑක් 10 ට සහ දකුණු ඇළට ජලය ලබාදී ඇති බවත්, වැඩි ජල ප්‍රමාණයක් ඇති නිසා ජලය ලබාදීම පිළිබඳ සාකච්ඡා කළ යුතු බවත් සඳහන් කරන ලදී. | තාක්ෂණික සහයක (බත්මැඩිල්ල) |
| වෑක් 1,2,3,4 ලෙස ක්‍රමානුකූලව ජලය ලබාදෙන ලෙසට ඉල්ලීමක් විය. | ගරු සභාපති, ගැමුණු ගොවි සංවිධානය |
| මේ වන විට ජල මුර ක්‍රමය ඉක්මන් විය යුතු වුවද, ගොවි මහතුන්ගේ අක්‍රමවත් ජල පරිහරණය නිසා මුර ක්‍රමයද තවත් දීර්ඝ වී ඇති බව පැවසුවේය. | ගරු ලේකම්, සුචරිත ගොවි සංවිධානය |
| අගෝස්තු 15 දිනෙන් ජල මුරය අවසන් වුවද දකුණු ඇළේ මුල කොටසට තවත් ජල මුර තුනක්වත් අවශ්‍ය බව පැවසුවේය. | ගරු සභාපති, දිලෙනතරු ගොවි සංවිධානය |
| පුස්ස ඇළේ පළමු කිලෝමීටරය තුළ පැන්නුම් හතරක් ඇති බවත්, ඉන් දෙකක් නවීකරණය කර ඇති අතර අනෙක් පැන්නුම් දෙක 1970 වසර වල නවීකරණය කළ ඒවා බැවින්, ඒවා මේ වන විට හැරී ඇති බව පැවසුවේය.<br>තවද, 2016 ගංවතුර හානිය නිසාත්, එම පැන්නුම් දෙක ඉතා ඉක්මනින් සකස් කිරීම අත්‍යවශ්‍ය බව සඳහන් කළේය. | ගරු සභාපති, සමගි ගොවි සංවිධානය |
| 2016 ගංවතුර හානිය පිළිබඳ ඇස්තමේන්තු යවා ඇති අතර ඒවාට මුදල් වෙන් විය යුතු බව පැවසීය.<br>පැන්නුම් අබලන් වූ ඒවා පිළිබඳව ගොවි සංවිධාන හරහා ලිපියක් සකස් කරදෙන ලෙසට උපදෙස් ලබා දුනි. | වාරිමාර්ග ඉංජිනේරු |
| පැරකුම් ගොවි සංවිධාන බල ප්‍රදේශ වල දැනට මාස 01/ 01 ½ වගාවන් පවතින බවත්,ඒ සඳහා තව ජල මුර කීපයක් අවශ්‍ය වේ ද යන්න ගැටළුවක්ව පවතින බවත් සඳහන් කළේය.<br>මුර ක්‍රමය සකස් කිරීමේදී වෑක් 2 අගාවතට අසාධාරණයක් සිදුවන නිසා නැවත එසේ නොවීමට කටයුතු කරන ලෙසට ඉල්ලීමක් විය. | සාමාජික, පැරකුම් ගොවි සංවිධානය |
| වාරිමාර්ග නඩත්තු නිසි ලෙස නොවුණොත් කන්න සඳහා ජලය ගෙන යාම අතිශයින්ම අපහසු බව පෙන්වා දුනි.<br>දැනට පවතින අවසන් ජල මුර නියමිත දිනට නවතා නඩත්තු කටයුතු ආරම්භ කරන බව දැන්විය.<br>ක්ෂේත්‍ර නිරීක්ෂණයේදී සෑම තැනකම ළපටි වගාවන් නිරීක්ෂණය සෑම තැනකම ළපටි වගාවන් නිරීක්ෂණය වූ අතර ඒවා අතුරු වගාවන් බව තහවුරු වූ බවත් ඒ සඳහා ජල මුර දීර්ඝ කළ නොහැකි බවත් අවධාරණය කළේය. | වාරිමාර්ග ඉංජිනේරු |
| සුළු වාරිමාර්ග වලින් අනවශ්‍ය ලෙස ජලය ගැනීම බත්මැඩිල්ල ජනපදයට හානිකර බවත්, ඔවුන්වද මෙම ක්‍රියාදාමයට සම්බන්ධ කරගත යුතු බවත් පැහැදිලි කළේය. | සාමාජික, පැරකුම් ගොවි සංවිධානය |
| ජනපදයට අයත් නීත්‍යානුකූල වගා බිම් ප්‍රමාණයද වැඩිකරගත නොහැකි නමුත්, සුළු වාරිමාර්ග වල පිරිස පිළිබඳ සමීක්ෂණයක් සිදුකර එම වගාවන් ක්‍රමානුකූල කිරීම වැදගත් බව සඳහන් කරන ලදී.<br>මීට පෙරද ඔවුන්ව රැස්වීම් වලට සහභාගී කරගැනීමට උත්සහ කළද නොහැකි වූ බවත් කීය. | වාරිමාර්ග ඉංජිනේරු |

| | |
|---|---|
| | |
| <u>**බදුළුමය ව්‍යාපාරය**</u> | |
| දැනට ඇළේ අඩි හතරක පමණ ජල ප්‍රමාණයක් පවතින බවත්, ජලය ලබාදීම සිදුවන බවත්, ඉදිරියේදී ජලයේ අඩු වීමක් වුවහොත් මුර ක්‍රමයකට ජලය ලබාදීමට සිදුවන බවත් පැවසුවේය. | තාක්ෂණික සහයක (බදුළුමය) |
| දැනට ජල ගැටළුවක් නැති බව පැවසීය. | ගරු සභාපති, වීර පැරකුම් ගොවි සංවිධානය |
| ඉහළ කොටස් වලට අවසන් ජල මුරය අගෝස්තු 30 ලෙස දැනගැනීමට ඇති බවත් ජලය නැවැත්වූ පසු මව් ඇළේ ප්‍රතිසංස්කරණ කටයුතු දින කීයක් සිදුකරනවාද යන්න වාරිමාර්ග ඉංජිනේරුගෙන් විමසීය. | ගරු සභාපති, වීර උදාර ගොවි සංවිධානය |
| නියමිත දිනට ජල මුරය අවසන් වන බවට සභාපතිවරුන් ගොවීන් දැනුවත් කළ යුතු බවත්, ලැබී ඇති සුළු ප්‍රතිපාදන වලින් හෝ මව් ඇළේ නඩත්තුව අනිවාර්යෙන්ම කළ යුතු බව සඳහන් කළේය.<br>තවද, ව්‍යාපාරයේ ආරම්භක ස්ථාන වල නිර්මිතයන් සෑදීමට ප්‍රතිපාදන වෙන් වී ඇති බවත් ඒවායේ තාක්ෂණය නිසා කාර්යයන් තවත් පහසු වන බවත් පැහැදිලි කරන ලදි.<br>එම නිසා නඩත්තු සඳහා මාස දෙකක්වත් අවශ්‍ය වන බව පැවසීය. | වාරිමාර්ග ඉංජිනේරු |
| යල කන්නය තුළ ජල ගැටළු පැවතුණු නිසා ගජබා ගොවි සංවිධානයේ 95% ම වගාව හානි වූ බවත්, බණ්ඩාරවෙල උමං ඔය ව්‍යාපෘතියේ ආරම්භයත් සමඟ හැල්පත් ජලයද සිඳී ගොස් ඇති බව පැවසීය.<br>තවද, අස්වනු සමීක්ෂණය කිරීමේදී ගොවි නියෝජිතයන්ගෙන් විමසා සිදුකරන ලෙසට යෝජනාවක්ද විය. | ගරු සභාපති, ගජබා ගොවි සංවිධානය |
| අස්වනු සමීක්ෂණය සඳහා ඇලවල් තීරණය කරනුයේ සංඛ්‍යාලේඛණ හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් බවත් එය ඔවුන්ගේ තීරණයක් නොවන බවත්, පැහැදිළි කළේය. | තාක්ෂණික සහයක (කෘ.දෙපා.) |
| වගා හානි සිදු වූ පසු කුමන නිළධාරියා දැනුවත් කරන්නේ ද යන්න විමසීය.<br>පොල්ලෙයායේ පැන්නුම ගැනද වාරිමාර්ග ඉංජිනේරුගෙන් විමසීය. | ගරු සභාපති, ගජබා ගොවි සංවිධානය |
| තවම එම වගා හානි චක්‍රලේඛ පිළිබඳ දැනුවත් නැති බව පැවසීය. | කෘ.ප.නි.ස (කන්දකැදුඋල්පත) |
| පොල්ලෙයායේ ගංවතුර හානියක් පවතින අතර ඒ සඳහා ඇස්තමේන්තු සකසා ඇති බව සඳහන් කළේය. | වාරිමාර්ග ඉංජිනේරු |
| ව්‍යාපාර දෙකේ පැවති වැඩ පිළිබඳ ඇස්තමේන්තු සඳහා ප්‍රතිපාදන ලබාගැනීමට අතිගරු ජනාධිපතිතුමාට ලිපියක් ලබාදුන් අතර ඒට පිළිතුරු වශයෙන් අධ්‍යක්ෂ ජනරාල්ට ලිපියක් යොමු කර ඇති බව පැවසීය. | ගරු සභාපති, සුචරිත ගොවි සංවිධානය |
| තවද, වගා හානි සඳහා සහනාධාර ලබාදීමේ දී ගොවි නියෝජිතයන් වශයෙන් ඔවුන් අපහසුතාවට පත්වන බවත් චක්‍රලේඛ වලට අනුගත වීමට වඩා මානුෂීය වශයෙන් සිතා කටයුතු කළ යුතු බව පැවසුවේය. | |

| | |
|---|---|
| ගොවි සංවිධාන සභාපති, ලේකම්, භාණ්ඩාගාරික යන නිළධාරීන් ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටුවට සහභාගී වී ගොවි සංවිධාන වල ගැටළු සාකච්ඡා කරන ලෙසටද නව නිළධාරීන්ගෙන් ඉල්ලීමක් විය. | |
| කාන්තා ගොවි සංවිධාන පිහිටුවීමෙන් පසු ඇතැම් නිළධාරීන් මුල් ගොවි සංවිධාන නොසලකා හරින බව කීය.<br>ගොවි සංවිධාන බල ප්‍රදේශයක් තුළ ඕනෑම වාරිමාර්ග හා කෘෂිකාර්මික කටයුත්තකදී අදාළ ගොවි සංවිධානය හරහා සිදුකරන ලෙස නිළධාරීන්ගෙන් ඉල්ලීමක් කළේය.<br><br>කාන්තා ගොවි සංවිධාන පිහිටුවීමට සිදුවූයේ රජයේ තීරණයට අනුව බවත්, ඒ පිළිබඳව වැරදි වැටහීමක් ඇතිකර නොගන්නා ලෙසට පැහැදිළි කළාය. | ගරු ලේකම්,<br>සුචරිත ගොවි සංවිධානය<br><br>කෘ.ප.නි.ස. |
| මිරිස් වගාවන් සඳහා බීජ බෙදා දීම ගොවි සංවිධාන වල නිර්දේශයන් හරහා සිදුකරන ලෙස ඉල්ලීමක් කළ අතර නැතහොත් අසාධාරණයක් වන බව ද පැවසීය. | ගරු සභාපති,<br>සුචරිත ගොවි සංවිධානය |
| කුඹුරු ඉඩම් වල නිවාස සෑදීමේදී එය තහනම් කර ඇති බැවින් ඊට අදාළ විසඳුම් මොනවාද සහ ඒ සඳහා අනුමැතියක් අවශ්‍යද යන්න විමසීය.<br>තිලවරණය මේ මස ඇතුළත පැවැත්වීමට දින ලබාදෙන ලෙස ඉල්ලීමක් කළ අතර, මීළඟ ව්‍යාපාර කමිටුවට තීන්දු තීරණ ගැනීමට ගොවිජන සංවර්ධන නිළධාරි ද සහභාගී කරවන ලෙස ඉල්ලීමක් කළේය. | |
| ව්‍යාපාර කමිටුව වෙනදාටත් වඩා වෙනස් ස්වභාවයක් ගත් බවත්, ප්‍රශ්න තර්ක විතර්ක තිබිය යුතු මෙන්ම ඒ පිළිබඳව සතුටු බව ප්‍රකාශ කළේය.<br>පසුගිය කන්න වලදී විනයගරුක නොවූ ගොවි පිරිසක්ද සිටි බව මතක් කළ අතර ඉදිරි කන්න වලදී එම තත්වය මඟ හරවා ගත යුතු බවත් මතක් කළේය.<br>ව්‍යාපාර කමිටු දින දර්ශනය ලබාදී ඇති අතර ඒ අනුව සෑම මසකම එදිනට කමිටුවට සහභාගී වන ලෙස දැනුම් දෙන ලදී.<br>බදුළුඔය/ බත්මැඩිල්ල වෙනත් ව්‍යාපාර වලට සාපේක්ෂව ඉහළ මට්ටමක පවතින බවද සඳහන් කළේය.<br>තවද ගොවි සංවිධාන වල නිළධාරීන් අතර සමීප සම්බන්ධතාවක් තිබිය යුතු බව පැවසීය.<br>රක්ෂණය, සුභසාධනය මතම යැපෙන්නට නොසිට ස්වෝත්සාහයෙන් ගොඩ නගා ගැනීමට කටයුතු කළ යුතු බව පැවසීය.<br>බත්මැඩිල්ල ඉහළ කොටසේ සුළු වාරිමාර්ග ගැටළුවටද සමීක්ෂණයක් මගින් ඒ සඳහා ස්ථිර විසඳුමක් ලබාගමු යැයි ද පැවසීය.<br>එමෙන්ම සියළුම දෙනා එකතු වී එක්දින ශ්‍රමදානයක් පැවැත්වීමට සූදානම් විය යුතු බවද සිහිපත් කළේය. | නේවාසික ව්‍යාපාර කළමනාකරු |
| **<u>කෘෂිකාර්මික සංවර්ධනය</u>** | |
| යල කන්නය අවසන් වී ගෙන යන අතර පැවති කාලගුණික තත්වය අනුව අක්‍රමවත් කන්නයක් බව පැවසීය.<br>මෙම කන්නයේ සාර්ථකත්වය බලා ඉදිරි කන්න වලට ද බීජ ලබාදීමට කටයුතු කරන බවත්, මිරිස් වගාවන් සඳහාද එම්.අයි/2 වර්ගයේ බීජ ලබාදීමට නියමිත බවත් පැළසුවේය.<br>බිම් සැකසීම සඳහාද රු.4000ක මුදලක් ලබාදෙන අතර සෑම මසකම නිශ්චිත දිනකදී බෝග සායන වැඩසටහනක් කිරීමටද සූදානම් බව ද පැවසීය. | තාක්ෂණික සහයක<br>(කෘ.දෙපා.) |

| | |
|---|---|
| සෝයා බෝංචි වගාව ද දැනට ක්ෂේත්‍රය තුළ පිහිටුවා ඇති අතර එහි තත්වය පරීක්ෂා කර බලා ඉදිරි කන්න වලදී වගා කිරීමට යොමුවන ලෙසද ඉල්ලීමක් කළේය.<br>තාක්ෂණික දැනුම සහ අත්දැකීම් යන දෙකම එකතුව වගාවන් කිරීම සාර්ථකත්වයට හේතුවන බව පැවසුවේය.<br>ආදර්ශන වගාවන් හෝ සිදුකර විකල්ප වගාවන්ට යොමුවිය හැකි බව ද සඳහන් කළේය. | |
| මැද කන්නයක් සිදුකිරීමට ගොවීන් සූදානම් වන නිසා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් ලබාදුන් සෝයා බීජ සඳහා තවදුරටත් ලබාදීමට සහනාධාර තිබේද යන්න විමසීය. | ගරු සභාපති,<br>සමගි ගොවි<br>සංවිධානය |
| සෝයා වගාවෙන් මාස තුනක්වත් අස්වනු ගැනීමට ගතවන නිසා සෝයා සුදුසුම වන්නේ යල කන්නයට බව පැහැදිළි කළ අතර අතුරු කන්න වලට සෝයා සුදුසු නොවන බව පැවසුවේය.<br>තවද, මේ වන විට ඒ සඳහා සහනාධාර ලබා දී අවසන් බවත් කීය. | තාක්ෂණික<br>සහයක |
| **ප්‍රිමා සමාගම** | |
| වසර පහළවකට පෙර සිට පැසිෆික් දෙමුහුම් බඩ ඉරිඟු හඳුන්වා දුන් සමාගමක් වන අතර එම ප්‍රභේදයන්හි නිෂ්පාදන පිරිවැය ඉහළ බවත්, ඔවුන් සතු බඩ ඉරිඟු ප්‍රභේද පිළිබඳ තවදුරටත් පැහැදිළි කරන ලදි. | නියෝජිත<br>(ප්‍රිමා සමාගම) |
| **යහපත් සෞඛ්‍ය පුරුදු පවත්වා ගැනීම** | |
| ගොවි මහතුන්ගේ නොසැලකිලිමත්කම හා නොදැනුවත්කම නිසා සිදුවන සෞඛ්‍ය ගැටළු පිළිබඳ දැනුවත් කළේය.<br>යහපත් සෞඛ්‍ය පුරුදු හා යහපත් පිළිවෙත් නිසා රෝගී වීමේ අවදානම මෙන්ම ජීවිත අවදානම පිළිබඳවද කරුණු පැහැදිළි කළේය.<br>ඉදිරියේ දී ගොවි සංවිධාන හා කමිටු රැස්වීම් වලදී තවදුරටත් ගොවීන් දැනුවත් කිරීමට එකඟතාවය පළ කළේය. | කාර්යභාර<br>වෛද්‍ය නිළධාරි,<br>කන්දකැටිය දිසා<br>රෝහල |
| **ස්තූතිය**<br>අද දින ව්‍යාපාර කමිටුවට සහභාගී වූ සියළුම දෙනාට ස්තූතිය ප්‍රකාශ කරන ලදි. | නේවාසික<br>ව්‍යාපාර<br>කළමනාකරු |

මෙයට,

.....................

එස්.එච්.එල්.දයාපාල

නේවාසික ව්‍යාපාර කළමනාකරු